## ලංකාතිලක ශ්‍රී විෂ්ණු දේවාලයේ ඇසළ පෙරහැර මංගල්‍යය



මෙම පෙරහැර මංගල්‍යය සිරිලක සුරකින ශ්‍රී උපුල්වන් දෙවියන්ට පූජෝපහාර පිණිස සෑම වසරකම පැවැත්වෙන අලංකාර චාරිත්‍රයකි. සම්ප්‍රදායිකව මහනුවර ඇසළ පෙරහැරේ කප් සිටුවීමට සමගාමීව සිදුවන කප් සිටුවීමේ මංගල්‍යයෙන් මසක් ඉකුත් වී එළඹෙන දින පැවැත්වෙන ඇතුල් පෙරහැර සමඟින් මෙය ආරම්භ වෙයි.

දින පහක් ඇතුල් පෙරහැරද දින පහක් කුඹල් පෙරහැරද තවත් දින පහක් රන්දෝලි පෙරහැරද පැවැත්වෙන අතර විශාල පිරිසක් ඒකරාශී කරවන මෙම ඇසළ පෙරහැර විචිත්‍රවත් සංස්කෘතික මංගල්‍යයකි. අවසාන රන්දෝලි පෙරහැරෙන් පසු අළුයම ගම්පොල බෝතලාපිටියේ මහවැලි ගං තොටුපලේදී දිය කැපීමේ චාරිත්‍රය සිදු කෙරේ.

මෙහිදී ඇම්බැක්ක, ගඩලාදෙණිය, වේගිරිය වැනි දේවාල වල පෙරහැරවල්ද සම්මුඛ වේ. අනතුරුව දවල් පෙරහැරෙන් ආපසු දේවාලය කරා පැමිණ සිදුකෙරෙන චතාවත් සමඟින් පෙරහැර මංගල්‍යය චාරිත්‍රානුකූලව අවසන් කෙරේ.

සංචාරක ආකර්ශන ස්ථානයන් සම්බන්ධව
කඳුරට ගුවන් විදුලි සේවයේ 107.5, 90.1, 107.3
ඔස්සේ දිනපතා
පෙ.ව. 6.40 ට විකාශය වන
"තොටුපල මංපෙත්"
වාර්තාමය වැඩසටහනට සවන් දෙන්න.

## හඟුරන්කෙත ඓතිහාසික ඇසළ පෙරහැර



මහනුවර ඇසළ පෙරහැර අවසන් වී දින 15 කින් පසු කප් සිටුවීමේ චාරිත්‍රයෙන් මෙම පෙරහැර ආරම්භ වේ. මෙය විෂ්ණු දේවාලයත්, පත්තිනි දේවාලයත්, පොත්ගුල් විහාරයත් එක්ව අති උත්කර්ෂවත් ලෙස පවත්වනු ලබයි.

මේ සඳහා ඇතුල් පෙරහැර, කුඹල් පෙරහැර හා රන්දෝලි පෙරහැර දින 5 ක් බැගින් පවත්වනු ලබයි. මෙහි ඇතුළත් වන අංගන් අතර කොඩිකරුවන්, වෙස් නැටුම්, පන්තේරු, ලී කෙළි, කසකරුවන්, ගිනි බෝලකරුවන්, සවරම් වැනි උඩරටට ආවේණික වූ සංස්කෘතික අංගයන්ගෙන්ද පහත රට නැටුම් වලින්ද සමන්විත වෙයි.

සෑම පෙරහැරක් ආරම්භ වන දිනකම දෙවියන් උදෙසා මුලුතැන් පූජාවක් පවත්වනු ලබයි. දිය කැපීමට පෙර "පෙහැලි බාන" නම් වූ චාරිත්‍රය ඉටු කරනු ලබයි. අවසාන රන්දෝලි පෙරහැරෙන් පසු මා ඔයේ තොටුපලේ දිය කැපීමේ චාරිත්‍රය ඉටු කර දවල් පෙරහැරෙන් පසුව රන් හැලියේ ඇති ද්‍රව්‍ය වලින් විශේෂ පූජාවක් පවත්වනු ලබයි.

## මාතලේ පල්ලේපොල ශ්‍රී අම්බොක්ක දේවාලයේ වාර්ෂික ඇසළ මහෝත්සවය



පත්තිනි දෙවියන්ගේ "ගිණි සළඹ" තැම්පත් කර ඉදිකර ඇතැයි සැලකෙන මෙම දේවාලය මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රධානතම පත්තිනි දේවාලය යි. මෙහි පත්තිනි දෙවියන් උදෙසා වාර්ෂිකව පුද පූජා පවත්වන අතර මාතලේ හා දඹුල්ල අවට සිංහල, දෙමළ ජනතාවගේ වැඳුම් පිදුම් වලට ලක් වී ඇති අම්බොක්ක ශ්‍රී පත්තිනි දේවාලයේ ඇසළ පෙරහැර එක්දහස් අටසිය ගණන් වල සිට ආරම්භ වී නොකඩවා මේ දක්වා පැවැත්වේ.

ඉපැරණි චාරිත්‍ර වාරිත්‍ර වලට අනුකූලව මහනුවර ඇසළ පෙරහැරට සමගාමීව කප් සිටුවීම මෙම පෙරහැරේ ආරම්භයයි. ඉන් දින 30 ක් ඇතුළතදී යෙදෙන සුභ මුහුරත අනුව මෙම පෙරහැරට ආවේණික වූ දොඩම් කෙළිය, කොහොඹ කළය, ගිනි කැරකවීම්, වෙස් හා හේවිසි ආදී තවත් අංග රාශියකින් මෙය සමන්විත වේ. මෙය කුඹල් හා රන්දෝලි යන පෙරහැර වලින් යුක්ත වන අතර අවසන් දින දිය කැපීමෙන් උත්සවය අවසන් කෙරේ.

## ගඩලාදෙණිය විහාරයේ ඇසළ පෙරහැර



මහනුවර ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීමත් සමඟ මෙම විහාරයේ පෙරහැර සඳහාද කප් සිටවනු ලැබේ. විෂ්ණු දෙවියන්ට හා දැඩිමුණ්ඩ දෙවියන්ට පූජෝපාහාර පැවැත්වීම සඳහා පවත්වනු ලබන මෙම පෙරහැර පන්තේරු, වෙස් නැටුම්, අලි ඇතුන් ආදියෙන් අලංකාර වන අතර එය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයින් රැසක් සහභාගී වෙයි.

ඇතුල් පෙරහැර, කුඹල් පෙරහැර හා රන්දෝලි පෙරහැරින් යුතුව දින 15 ක් පුරා පැවැත්වෙන මෙහි විෂ්ණු හා දැඩිමුණ්ඩ දෙවියන්ගේ රන් ආයුධ වැඩමවීම සිදුකරයි.

රන්දෝලි පෙරහැරෙන් පසුව ගැටඹේ දිය කපනා තොටේදී දිය කැපීමේ චාරිත්‍රය ඉටු කරයි.

# වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව

### මධ්‍යම පළාත

# මධ්‍යම පළාතේ සංස්කෘතික උත්සව




වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව
අංක 1054, ගැටඹේ, පේරාදෙණිය.
දුරකථන / ෆැක්ස් : 081 - 2387118
ඊමේල් : tradecomtourcpc@gmail.com
වෙබ් අඩවිය : www.tourism.cp.gov.lk

